# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2430/37 – 2025 අප්‍රේල් මස 04 වැනි සිකුරාදා – 2025.04.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2024/58.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

කේ. ඒ. ජගත් පී. පෙරේරා මයා, ‘‘ප්‍රියන්දි’’, කන්‍යාරාම පාර, කලමුල්ල, කළුතර.

සහ

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, අංක 80, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන්

1A – G 044140 – 14 (2025/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිවඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 04, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2024/58.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ඒ. ජගත් පී. පෙරේරා මයා, ‘‘ප්‍රියන්දි’’, කන්‍යාරාම පාර, කලමුල්ල, කළුතර.

සහ

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, අංක 80, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

“ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සේවය කරනු ලබන කේ. ඒ. ජගත් පී. පෙරේරා මහතාට 2010 මාර්තු 23 දින සිට කණිෂ්ඨ කළමනාකරු තනතුර සඳහා හිමිකමක් තිබේ ද? , යන්නත් එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.”

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 මාර්තු මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04 – 0036

---

මගේ අංකය: IR/COM/02/2022/18.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

1. එන්. සී. කේ. විජේකෝන් මයා, නො. 125ඩී, කණුකැටියවත්ත, තිත්තපත්තර.

2. ජේ. කේ. සමරජීව මයා, නො. 105, සිගේරා පාර, මාදිවෙල, කෝට්ටේ

සහ

අනෙක් පාර්ශ්වයක් වශයෙන්

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, අනගාරික ධර්මපාල මාවත, නො. 32/26 එල්, එම්. එම්. අයි. ආර්. ඒ. ජයතිලක මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2022/18.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

1. එන්. සී. කේ. විජේකෝන් මයා, නො. 125ඩී, කණුකැටියවත්ත, තිත්තපත්තර.

2. ජේ. කේ. සමරජීව මයා, නො. 105, සිගේරා පාර, මාදිවෙල, කෝට්ටේ

සහ

අනෙක් පාර්ශ්වයක් වශයෙන්

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෙරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි ගිනි නිවන නිලධාරී තනතුරේ සේවය කරන එන්. සී. කේ. විජේකෝන් මයාට සහ ජේ. කේ. සමරජීව මයාට B - i ශ්‍රේණියේ ගිනි නිවන නිලධාරී තනතුර සඳහා හිමිකමක් තිබේ ද එසේ හිමිකමක් තිබේ නම් එය ලබා නොදීම සහ සේවා වැඩ මුර දීමනාව සඳහා හිමිකමක් තිබේ ද හිමිකමක් තිබේ නම් එය ලබා නොදීම මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද හා කෙදිනක සිටද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 මාර්තු මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04 – 0037

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.